**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (02 වන කොටස)

**ADB ණය අංක : 3030 SRI (SF)**

## කොළඹ මහා නගර සභා බල ප්‍රදේශය තුළ, ගුරුත්ව මළාපවාහන නල වල තත්ත්ව තක්සේරුව හා හදිසි අලුත්වැඩියා කටයුතු ලොට් A - CCTV සහිත ගුරුත්ව මළාපවාහන නල කි.මී. 89 සහ ලොට් B - විශේෂ ආම්පන්න (Special Device - SD) සහිත කි.මී. 8.2 ක පීඩන නල

**ICB කොන්ත්‍රාත් අංක : GCWWMIIP-P2/ADB/RQ/DSIDC/ICB-01/2019**

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත, ආසියානු සංවර්ධන බැංකුව (ADB) වෙතින්, මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ අයෝජන වැඩසටහන (02 වන කොටස) හි පිරිවැය සඳහා ණය මුදලක් ලැබී ඇති අතර, ඉන් කෙටසක්, ඉහත සඳහන් කොන්ත්‍රාත්තුව යටතේ වන සුදුසුකම්ලත් ගෙවීම් ආවරණය කිරීම සඳහා යෙදවීමට අපේක්ෂිතය. ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) සුදුසුකම්ලත් ප්‍රභව රටවල ලංසුකරුවන් සඳහා මෙම ලංසුකරණය විවෘතය.

02. ඒ අනුව, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (මින් මතුවට සේවායෝජක ලෙස හැඳින්වේ) වෙනුවෙන්, අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුවේ (CAPC) සභාපති විසින්, ඉහත සඳහන් කොන්ත්‍රාත්තුව සඳහා සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින්, මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලබන අතර, එහි කෙටි විස්තරයක් පහතින් පළවේ.

| ලොට් අංකය | කාර්ය විෂය පථය කෙටියෙන් | නිම කිරීම සඳහා කාලය |
|---|---|---|
| **ලොට් A** | තත්ත්ව තක්සේරුව හා හදිසි අලුත්වැඩියා කටයුතු - CMC බල ප්‍රදේශය තුළ (දිස්ත්‍රික් 3, දිස්ත්‍රික් 4 හා දිස්ත්‍රික් 5) CCTV භාවිතා කරමින් කි.මී. 89 ක් වන ගුරුත්ව මළාපවාහන නල සඳහා<br>● මළාපවාහන නළ පවිත්‍ර කිරීම - කි.මී. 89<br>● CCTV භාවිතා කරමින්, "විෂ්කම්භය 300 - 1500mm" ප්‍රමාණයෙන් වූ මළාපවාහන නළ මාර්ග කි.මී. 89 පමණ තත්ත්ව තක්සේරු කිරීම හා හදිසි අලුත්වැඩියාවන් සිදු කිරීම.<br>● පවතින, හානි සිදුවූ භූගත මළාපවාහන නළ මාර්ගවල අභ්‍යන්තර හා බාහිර අලුත්වැඩියා කටයුතු<br>● හානි සිදුවූ MH කවර අලුත්වැඩියාව හා ආදේශ කිරීම | දින 595 |
| **ලොට් B** | තත්ත්ව තක්සේරුව හා හදිසි අලුත්වැඩියා කටයුතු - CMC බලප්‍රදේශය තුළ (දිස්ත්‍රික් 2B හා දිස්ත්‍රික් 5) කි.මී. 8.2 ක්, SD භාවිතා කරමින් පීඩන නල සඳහා<br>● විශේෂ මෙවලම් (SD) භාවිතා කරමින් කි.මී. 8.2 පමණ වූ පීඩන මළාපවාහන ප්‍රධාන නළ මාර්ගය (500mm විශ්කම්භය, 600mm විෂ්කම්භය හා 1100mm විෂ්කම්භය) තත්ත්ව තක්සේරු කිරීම හා හදිසි අලුත්වැඩියා කටයුතු | දින 252 |
| **ලොට් A හා ලොට් B** | මෙම දෙකම ඉහත වගුවේ විස්තර කොට ඇති පරිදි වේ. | ලොට් A<br>දින 595<br>ලොට් B<br>දින 252 |

03. ආසියානු සංවර්ධන බැංකුවේ තනි - අදියර : තනි - කවරය ලංසු ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් මෙම ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණය පවත්වනු ලැබේ. අදාළ සුදුසුකම් හා නිපුණතා අවශ්‍යතා, ලංසු ලේඛනයන්හි 3 කොටසේ සඳහන්ව ඇත.

04. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට නොමිලයේ ලංසු ලේඛන පරීක්ෂා කිරීමත්, වැඩිදුර විස්තර ලබා ගැනීමත්, 9 ඡේදයේ සඳහන් ලංසු භාර ගැනීමේ අවසන් දින දක්වා, රාජකාරී දිනවල 9.00 පැය හා 16.00 පැය අතර, කාලය තුළ, කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවතේ, අංක 86, මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - කොටස 2 හි ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයේදී කළ හැකිය. දූරකථන : (94) (11) 2665331 හා ෆැක්ස් : (94)(11) 2665330 හෝ ඊමේල් : pdgcwmp@sltnet.lk

05. ඕනෑම උනන්දුවක් දක්වන ලංසුකරුවකුහට බැලීම සඳහා PDF ආකෘතියෙන් යුත් ලංසු ලේඛනයේ මෘදු පිටපතක් පහත වෙබ් අඩවියේ ඇත. කෙසේ වෙතත් එම ලේඛන බැලීම සඳහා පමණක් අදාළ වන අතර, ලංසු ඉදිරිපත් කිරීම සඳහා වලංගු නොවේ.

https://drive.google.com/drive/folders/1nM8bgyLBKK1UCcFsSP2fGoNghilQKaMT?usp=sharing

06. ආපසු ගෙවනු නොලබන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් ලක්ෂයක් (ශ්‍රී ලං.රු. 100,000.00) හෝ ඇමරිකන් ඩොලර් පන්සිය හැටක් (ඇ. ඩො. 560) ගෙවීමෙන් හා ඉහත 4 ඡේදයේ සඳහන් ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, රාජකාරී දිනවල 09.00 පැය හා 16.00 පැය අතර කාලය තුළ, ලංසුකරුවන්හට, සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. සියලුම ගෙවීම් මුදලින් හෝ "**මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන**" නමට, ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ බැංකුවකින් ලබාගත් සහතික කළ චෙක්පතක් / ඒක්ෂණ අණකරයක් මගින් සිදුකළ හැක. අදාළ ලංසු ලේඛන, පුද්ගලිකව පැමිණ ලබා ගැනීම හෝ ගෙවීම් ලදුපත ලත් පසු, දේශීයව තැපැල් මගින් නොමිලයේ ගෙන්වා ගත හැක. නැතහොත් තම රටෙහිදී, ලංසුකරු විසින් අදාළ ගෙවීම් කළ බවට සාක්ෂි ලෙස ෆැක්ස් කළ පිටපතක් ඉදිරිපත් කිරීමෙන් සීඝ්‍රදූත සේවය මගින් ද ගෙන්වා ගත හැක. එසේ වුවද එවන් අවස්ථාවන්හීදී සිදුවිය හැකි අස්ථානගතවීම් හෝ ප්‍රමාද වීම් සම්බන්ධයෙන් කිසිදු වගකීමක් භාර ගනු නොලැබේ.

07. මේ සම්බන්ධව වැඩබිම් චාරිකාවක් 2020 ජූලි 31 දින 09.30 පැයට ආරම්භව පවත්වනු ලබන අතර, එම දිනයේදීම පෙර - ලංසු හමුවක් ඉහත 4 ඡේදයේ සඳහන් ලිපිනයේදී 14.30 පැයට ආරම්භ කිරීමට නියමිතය. මෙම අවස්ථා දෙකටම සහභාගී වන ලෙසට ලංසුකරුවන්හට උපදෙස් දෙනු ලැබේ. කෙසේ වෙතත් කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පැන නැඟී ඇති වර්තමාන තත්ත්වය යටතේ වන සීමාවන් නිසා පුද්ගලිකව පැමිණීමට අපහසු ලංසුකරුවන් සඳහා ඉන්ටර්නෙට් යෙදවුමක් තුළින් වෙබ් සම්මන්ත්‍රණ සඳහා පහසුකම් සලස්වනු ලැබේ.

08. අදාළ භාරගැනීමේ අවසාන දිනයේ සිට (හෝ යම් දීර්ඝ කිරීමක් කළහොත් එම දිනයේ දිනයට) ලංසු, දින 147 ක් දක්වාත්, ලංසු ඇපකර දින 175 ක් දක්වාත් වලංගු විය යුතුය.

09. ලංසු ලේඛනයන්හි සඳහන් ආකෘතියේ හා විස්තර ප්‍රකාරව සකස් කළ ලංසු, ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ශ්‍රී ලංකාවේ, කොළඹ 02, යුනියන් පෙදෙසේ, අංක 330, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ (ප්‍රධාන ගණකාධිකාරීගේ අවධානයට) අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලිපිනය ලියා අදාළ ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන්, 2020 අගෝස්තු 28 දින 15.00 පැයට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

10. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

11. ලංසු පිළියෙල කිරීමේදී හෝ ගෙනැවිත් භාර දීමේදී හෝ පෙර - ලංසු හමුවට සහභාගී වීමේදී ලංසුකරුවන්හට සිදුවිය හැකි යම් පිරිවැය හෝ වියදම් සම්බන්ධයෙන්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ කිසිදු වගකීමක් නොදරයි.

**ලේකම්,**
**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.**